# දන්ත වේෂ්ට රෝගය සඳහා යොදන ලද දේශීය දන්තෞෂධයක් මත ප්‍රජා මුඛ සෞඛ්‍ය රැක ගැනීම.

කොළඹ විශ්ව විද්‍යාලයීය දේශීය වෛද්‍ය විද්‍යායතනයේ
දර්ශනපති (ආයුර්වේද) පශ්චාත් උපාධිය සඳහා
ඉදිරිපත් කරනු ලබන නිබන්ධය

එච්. ඒ. එල්. රාමනායක

ස්වස්ථවෘත්ත අගද දෙපාර්තමේන්තුව
දේශීය වෛද්‍ය විද්‍යායතනය
කොළඹ විශ්ව විද්‍යාලය
ශ්‍රී ලංකාව.

1996

දර්ශනපති ආයු/93/018

# සාරාංශය.

ප්‍රජාවගේ මුඛ සෞඛ්‍ය රැක ගැනීම පිළිබඳව අද පමණක් නොව ඉතා ඈත අතීතයේද විශේෂ උනන්දුවක් දැක්වූ බැව් චරක සුශ්‍රැතාදී මූලික ආයුර්වේද ග්‍රන්ථවල දක්වා ඇති විස්තර අනාවරණය කරයි. අතීතයේදී මුඛ රෝග සඳහා දක්වා ඇති විස්තර සටහන් හා නවීනයන් සොයා ගන්නා විස්තර කිසියම් එකඟ තාවයක් දැක්වීම නිසා ආයුර්වේද මූලික ග්‍රන්ථවල දක්වා ඇති ප්‍රතිකාර විධිද ප්‍රතිඵල රහිත යයි ඉවත දැමිය හැකි නොවේ. දක්වා ඇති ප්‍රතිකාර අනුසාරයෙන් සාදා ගත් සරල ඖෂධයක් සරල ලෙසින් උපයෝගී කර ගැනීමෙන් බොහෝ මුඛ රෝගයන්ට පාදක වූ දන්ත වේෂ්ට රෝගයට ප්‍රතිඵල දායක මෙන්ම නිරෝගීන්ගේ මුඛ සෞඛ්‍ය රැක ගැනීම පිණිස දින චර්යාවේ අංගයක් වූ දත් මැදීම සඳහා ඖෂධයක් සකසා ගැනීමට හැකි විය. සාමාන්‍ය ජනතාවගේ චර්යා රටා සමීක්ෂණයට භාජනය කිරීමට ඵලදායි ඖෂධයක් සමග ප්‍රවේශ වීම සාර්ථක විය. එමගින් ඔවුන්ගේ වැරදි මුඛ චර්යා නිවැරදි කරමින් තම තමන්ගේ පුද්ගල සෞඛ්‍ය පිළිබඳව විශ්වාසයක් ගොඩ නැංවීමටද හැකිවිය. එසේම වඩාත් ඵලදායි ලෙස දේශීය ඖෂධ පහසු ආකාරයෙන් භාවිතා කිරීමේ වැදගත් කම අවබෝධ කරලීමට හැකිවිය.

වර්තමාන අධ්‍යයනය තුල වඩාත් ප්‍රථිඵල දායි ක්‍රියාකාරි ඖෂධයක් යොදා ගැනීම නිසා දේශීය මුඛ සෞඛ්‍ය ආරක්ෂක ක්‍රම පිළිබඳව විශ්වාසයක් ගොඩ නැගීමේ හේතුවෙන් මුඛ රෝගයන් සඳහා ආයුර්වේද රෝහල් කරා ද ජනතාව යොමු කරවීමට හැකිවිය.

සායනික අධ්‍යයනයට රෝගීන් තෝරා ගැනීමේදී රෝග ලක්ෂණ පදනම් කොට රෝගීන් 24 ක් කොටස් 2 කට බෙදා වෙන්කර ඇත. පලවන කණ්ඩායම විදුරුමසින් ලේ යාම, වේදනාව, ශෝථය, සැරව පිටවීම, ක්ෂය වූ විදුරු මස් සහිත රෝගීන් ඇතුලත් වූ අතර දෙවන කණ්ඩායමට ඉහත ලක්ෂණ මත ශාරීරික හිසරදය කැස්ස උදර දාහය වැනි ආබාධ හා අවුරුදු 1 ට වඩා වැඩි කල් ගත රෝගීන් ද ඇතුලත් විය.

ඖෂධ භාවිතයේදී පලවන කණ්ඩායම ක්ෂණිකව රෝග ලක්ෂණ වැඩිවීමක් පෙන්නුම් කර පසුව ක්‍රමයෙන් රෝග ලක්ෂණ පහ වී සුවය පෙන්විය. දෙවන කණ්ඩායම රෝගී උපරිම ලක්ෂණ හා ආශ්‍රිත රෝග ලක්ෂණයන්ගෙන් මල බද්ධය හැර අනෙකුත් ලක්ෂණ පහ වී සුවය පෙන්විය.

ඖෂධ සංයෝජනයේ උපරිම ක්‍රියාකාරීත්වය කෂාය තික්ත හා කටු රස ප්‍රමුඛ විය. මේ නිසා ලේ ගැලීම වේදනාව ශෝථය සුවවේ. තික්ත හා කටු රස ඖෂධ මැලියම් හා කුණු ඉවත් කිරීමට ආධාර වේ. කඵ පිත්ත හර වාත ශාමක ව්‍රණ රෝපන ද්‍රව්‍යයන් ඖෂධයේ ද්‍රව්‍යය වැඩි ගණනක ඇත. මේ නිසා නිති පතා මුඛ සෞඛ්‍ය පවත්වා ගැනීමට ඖෂධය ආධාරකය වේ. දේශීය දන්ත ඖෂධයකට නැඹුරු වීම නිසා සමීක්ෂණය සඳහා උපයෝගී කරගත් දන්ත ඖෂධයට අමතරව ඒකීය ඖෂධයක් ලෙසින් තනා ගත් මගුල් කරඳ පොතු චූර්ණය පසු ඇගයීම් කළ පුරා වසරක්ම යෙදීමට සිදුවිය. මේ හැර මුඛ සෞඛ්‍ය පවත්වා ගැනීම සඳහා දෙන ලද ආයුර්වේද උපදෙස් පිළිබඳව ජනතාව තුල විශ්වාසයක් ගොඩ නැගුනා පමණක් නොව අනාගතයේදී මෙම ක්ෂත්‍රයේ ක්‍රියාත්මක වන අයට යහපත් ප්‍රතිඵල ලබාගත හැකි තත්ත්වයක්ද උදා විය. එමගින් ජාතික හා ජාත්‍යන්තර මුඛ සෞඛ්‍ය වැඩ සටහන්වලට දායක වීමේ අවස්ථාවද ආයුර්වේද රෝහල් තුල විදුරු මසේ රෝග සඳහා නිකුත් කළ හැකි ඖෂධයක් තීරණය කර ගැනීමටද හැකිවිය.

විවිධ රෝගයන් සඳහා දූෂිත වූ විදුරු මස් හේතුවන නිසා ජනතා සෞඛ්‍යය හා මුඛ සෞඛ්‍යය රැක ගැනීමේ උපදෙස් පහසු ලෙස ජනතාවට දීමෙන් අනාගතයේදී සෞඛ්‍යමත් ජනතාවක් රටට දායක කොට දිය හැකිය.